පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය - ඔක්තොම්බර් - සතිය - 03

ශ්‍රේණිය - 9



සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.



Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province


ක්‍රියාකාරකම : **ශාන්තිකරම හඳුනාගනිමු. (2 - කොටස)(පහන් මඩුව)**

**උඩරට නර්තන සම්ප්‍රදාය**

අරමුණු -

- ශාන්තිකර්ම පිළිබඳව යන්න විස්තර කරයි
- ශාන්තිකර්ම පිළිබඳව යන්න හඳුනාගනියි
- සහයෝගයෙන් කටයුතු කරයි
- දැනුම හා අත්දැකීම් අනෙක් අය හා හුවමාරු කර ගනී
- සතුටින් විවේකය ගත කරයි

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ මීට පෙර සතියේදි ඔබ අධ්‍යනය කළ ශාන්තිකර්ම පිළිබඳව තොරතුරු නැවත මතකයට නගා ගන්න.

දෙවන පියවර :මෙම සතියේදී ඔබ තවත් ශාන්තිකර්මයක් පිළිබඳව තොරතුරු සොයා බැලීය යුතුව ඇත.

තුන්වන පියවර : පහත සටහන කියවා ගිය සතියෙහි සිව්වන පියවරේ ප්‍රශ්න වලට මෙම ශාන්තිකර්මය ඇසුරින්ද පිළිතුරු සැපයීමට හැකිදැයි බලන්න.

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභ සිද්ධිය අරමුණු කොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේගයන්ගේ ආශිර්වාදයෙන් ඇති වි තිබෙන රෝග උපද්‍රව දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

**ශාන්තිකර්ම පැවැත්වීමට හේතු වූකරුණු:-** අතීතයේ පැවැත්වීමට හේතුව - පඬුවස් දෙව් රජුට වැදුණු දිවිදොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම.වර්තමානයේ පැවැත්වීමට හේතුව- ධන, ධාන්‍ය, ගව, මහිෂාදි භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම/ පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුව කර ගැනීම/ගමකට, ප්‍රදේශයකට, මුළු රටට ම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම / ආධ්‍යාපනික අවශ්‍යතා

**පුරාවෘත්ත කථාව :-** සේරමාන් නම් රජුගේ උයන පාළු කරමින් සිටි ගෝණකු මරා දමන ලෙසට අණ කරන ලද හෙයින් හේවායන් ඌ පසු පස එළවා යන අවස්ථාවේ ගෝණාගේ පය පැටලී අසල තිබූ පොකුණකට වැටී මරණයට පත් විය. තමා මේ විපතට පත් වීමට හේතු වූයේ රජතුමාගේ අණ කිරීම බව දැනගත් ගෝණා රජු කෙරෙහි වෛරයෙන් මිය ගොස් මෙම පොකුණෙහි කුඩා මැඩියකු වී උපදී. දිනක් රජු පොකුණට යන අවස්ථාවේ පිපී තිබූ මලක් කඩා එහි සුවඳ ආඝ්‍රාණය කරන විට එහි සිටි කුඩා මැඩියා නාසයට ඇතුළු වීම හේතුවෙන් රජුට බලවත් හිසරදයක් ඇති විය. ඉන් රෝගී තත්වයට පත් නොයෙකුත් ප්‍රතිකාර කරන ලද නමුදු ඉන් සුවයක් නොලැබිණි. දිනක් රජුට ඉතා රූමත් කාන්තාවක් සිහිනයෙන් පෙනුණා ය. ඒ බව පුරෝහිත බමුණාට සැල කර සිටියේ ය. පුරෝහිත බමුණාගේ අදහස වූයේ සිහිනෙන් පෙනී සිටියේ පත්තිනි දේවිය බවත්, ඇගේ සාපයක් රජුට ඇති බවත් ය. බුද්ධාගම ස්ථාපිත රටකට ගොස් පත්තිනි දේවියට පින් පැමිණවිය යුතු බව දන්වා සිටිය හෙයින් ඊට සුදුසු ම රට ලංකාව බව තීරණය කළ රජු සීනිගමින් දිවයිනට පැමිණ රුවන්වැල්ලේ දී ප්‍රථම දෙවොල් මඩුව කර වී ය. එදා පටන් රජුගේ හිසරදය දුරු වූ බැවින් ලක්දිව දෙවොල් මඩුව ආරම්භ වූ බවත් කියවේ.

**පුද ලබන දෙවිවරු:-** පත්තිනි,දැඩිමුණ්ඩ, කතරගම, වාහල, විෂ්ණු, දෙවොල්, සමන්
**නර්තන අංග :-** පන්දම් පද, දේවකෝල් පාඩුව, මුදුන් තාලය, යහන් දැක්ම, හත් පද පෙළපාලිය, මල් පද නැටීම
**නාට්‍යමය අංග :-** අඹ විදමන, දෙවොල් ගොඩ බැසීම, අසුර යක්කම, රාමා මැරීම, පොක්කඩේ පාලිය
**චාරිත්‍ර විධි:-** කප් සිටුවීම, මඩු පේ කිරීම, පහන් දැල්වීම, මිල්ල ගස පේ කිරීම, තොටමෙට යාම, දේවාරාධනාව, හළඹ වැඩමවීම, ගිනි පෑගීම, භූමි දෙවියන්ගෙන් අවසර ඉල්ලා කරන යාතිකාව, උපත් කවි ගායනය
**රංග වස්ත්‍රාභරණ :-** පබළු ඇඳුම් කට්ටලය - මෙය සමන් දෙවියන්ගේ ඇඳුමට සමාන වේ.
දෙවොල් ඇඳුම් කට්ටලය - දෙවොල් දෙවියන්ගේ ඇඳුමට සමාන කමක් දක්වයි.
**රංග සැරසිලි :-** පත්තිනි තොරණ, දෙවොල් තොරණ, කුරුම්ඹර තටුව, පූනාව.

**රංග උපකරණ (භාණ්ඩ):-** හත් පදයට භාවිත කරන රංග භාණ්ඩ හෙවත් පූජා භාණ්ඩ(බුලත්, දුම්මල, තැඹිලි ගෙඩිය,පුහුල්, සළුව, පොල් මල, කහ දියර, ධාන්‍ය යෙදූ මුට්ටිය), පන්දම්, පොල්මල්, දුන්න, ඊතලය, ආදිය.
**මඩුව සැකසීම සඳහා :-** උණගස්,පුවක් ගස්,කෙසෙල් කොට, හබරල කොළ,පුවක් මල්/පොල් මල්,ගොප් අතු,පුවක් වලු/පොල් වලු තැබිලි වලු, රඹ කැන්,බුලත්,දෝතලු

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.



Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa


**පහතරට නර්තන සම්ප්‍රදාය**

ක්‍රියාකාරකම : **<u>ශාන්තිකර්ම හඳුනාගනිමු. (2 - කොටස) (කොහොඹාකංකාරිය)</u>**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ මීට පෙර සතියේදි ඔබ අධ්‍යනය කළ ශාන්තිකර්ම පිළිබඳව තොරතුරු නැවත මතකයට නගා ගන්න.

දෙවන පියවර :මෙම සතියේදී ඔබ තවත් ශාන්තිකර්මයක් පිළිබඳව තොරතුරු සොයා බැලීය යුතුව ඇත.

තුන්වන පියවර : පහත සටහන කියවා ගිය සතියෙහි සිව්වන පියවරේ ප්‍රශ්න වලට මෙම ශාන්තිකර්මය ඇසුරින්ද පිළිතුරු සැපයීමට හැකිදැයි බලන්න.

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභ සිද්ධිය අරමුණු කොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේගයන්ගේ ආශිර්වාදයෙන් ඇති වි තිබෙන රෝග උපද්‍රව දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

**පැවැත්වීමට හේතු වූ කරුණු:-** අතීතයේ පැවැත්වීමට හේතුව - පඬුවස් දෙව් රජුට වැදුණු දිවිදොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම. වර්තමානයේ පැවැත්වීමට හේතුව- ධන, ධාන්‍ය, ගව, මහීෂාදි භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම/ පුද්ගලයන්ට බලපාන රෝගාබාධයන් සුව කර ගැනීම/ගමකට, ප්‍රදේශයකට, මුලු රටට ම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම / ආධ්‍යාපනික අවශ්‍යතා.

**පුරාවෘත කතාව:-** විජය රජු කුවේණිය සහ ජීවහත්ත, දිසාල නම් දරු දෙදෙනා පලවා හැරීම හේතුවෙන් කෝපයට පත් කුවේණි විජය රජුට ශාප කළා ය. විජය රජුගේ ඇවෑමෙන් රජ පැමිණි පඬුවස්දෙව් සිහිනෙන් දිවි වෙසක් දැක බියපත් වී බලවත් සේ රෝගාතුර විය. මෙම දිවි දෝෂය දුරු කිරීම සඳහා නොයෙකුත් සෙත් ශාන්ති කළ නමුත් ඉන් සුව නොවී ය. ඉන්පසු මෙම සිද්ධිය ශක්‍ර දේවේන්ද්‍රයාට සැල කරන ලදී. දිවියකු සිහිනෙන් දැක බියවීමෙන් හටගත් රෝගයක් බැවින් මලෙන් උපන් කෙනෙකු සොයා යාග කරන ලෙස උපදෙස් දෙන ලදී. මලෙන් උපන් කුමාරයා ගෙන්වා රෝගය සුවපත් කිරීමේ කාර්යය රාහු අසුරේන්ද්‍රයාට භාර කළේ ය. රාහු අසුරේන්ද්‍රයා ඌරු වෙසක් මවාගෙන සත් මුහුදෙන් එතෙර වී මලය රටට ගොස් රජුගේ නන්දන උයන විනාශ කර මලය රජුගේ නුවරට වැදී මාළිගා කඩා බිඳ දුවන විට මලය රජු, කිත්සිරු, සඳලිඳු යන තුන්දෙනා ඇතුළු සේනාව ඌරා ලුහුබැඳ ලක්දිවට පැමිණියේ ය. සත් මුහුද පීනාගෙන ආ ඌරා හන්තාන කන්ද අසල දී ගලක් බවට පත් විය. එතැනට පැමිණි සක්දෙව් රජු මලය රජු ඇතුළු පිරිස ගෙන්වා ගත් හේතුව විස්තර කළේ ය. ඉන් පසු මලය රජු ඇතුළු පිරිස පඬුවස්දෙව් රජුගේ දිවි දෝෂය සුව කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කළහ. අනතුරු ව අනුරාධපුරයේ මහමෙවුනා උයනේ සැට රියනක් දිග තිස් රියනක් පළල පස් රියනක් උස මණ්ඩපයක් තනවා වටතිර ඇද උඩවියන් බැඳ පාවඩ දමා සරසන ලද මණ්ඩපයෙහි හැටපස් මංගල්‍ය කර පඬුවස් දෙව් රජුගේ දිවි දෝෂය සුවපත් කළහ.

**පුද ලබන දෙවිවරු:-** ඉරුගල් බණ්ඩාර,කන්දේ බණ්ඩාර ආදි බණ්ඩාර දෙවි සත් කට්ටුව, කොහොඹා දෙවි තුන් කට්ටුව, උඩුවේරිය බණ්ඩාර, වීරමුණ්ඩි දෙවි, පුදලබන යකුන්:- කඩවර, වලියක් තුන් කට්ටුවක් (වැදි යක්,මෙලෙයි යක්,රුප්පා යක්)

ගායනය සහිත අස්නේ, කොහොඹාහැල්ල, මඩපුරුය, දාන පහ, කතා පහ. ගායනය රහිත නර්තන අංග:- යක් ඇනුම, හත්පදය, දුනුමාලප්පුව, කෝල් පාඩුව, ආවැන්දුම. නාට්‍යමය අවස්ථා:- යක්කම් පහ, ගබඩා කොල්ලය, මුවමල විදීම, මාරාව, ගුරුගේ මාලාව.

**චාරිත්‍ර විධි:-** කප් සිටුවීම, මඩුව සෑදීම, මඩු පේ කිරීම, මුරුතැන් පිසීම, තොට පේ කිරීම, නානු මුර මංගල්‍යය, මල පේ කිරීම, කඩවර ගොටු දීම, ආභරණ වැඩමවීම, දෙවියන් වැඩමවීම, මංගල භේරි වාදනය. වාදන අවස්ථා:- මඟුල් බෙර වාදනය, අත්‍යා බෙර වාදනය.

**රංග වස්ත්‍රාභරණ:-** උඩරට නර්තන සම්ප්‍රදායයේ කෝෂ්ඨාගාරය ලෙස හැඳින්වෙන කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ දී යක්දෙස්සන් විසින් පළඳිනු ලබන සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලය වෙස් ඇඳුම් කට්ටලය නමින් හැඳින්වේ.

**රංග උපකරණ (භාණ්ඩ):-** හත් පදයට භාවිත කරන රංග භාණ්ඩ හෙවත් පූජා භාණ්ඩ(බුලත්, දුම්මල, පොල් ගෙඩිය, සළුව, පොල් මල, කහ දියර,ධාන්‍ය යෙදූ මිට්ටිය), පොල්මල්, දුන්න, ඊතලය, කෙසෙල් බඩෙන් සාදා ගන්නා ලද ඌරා, කෝලායුධය, පැහිඳුම් පෙට්ටිය ආදිය.

**වාද්‍ය භාණ්ඩ:-** ගැටබෙරය, තාලම්පට, ආභරණ වැඩමවීමේ දී දවුල, තම්මැට්ටම, හොරණෑව භාවිත වන අවස්ථා ද තිබේ.

**සැරසිලි:-** කොහොඹා කංකාරි මඩුව ,අයිලය, යහන.

**යොදා ගන්නා අමුද්‍රව්‍ය:-** පස්වලු (දෝතළු, පුවක්, පොල්, තැඹිලි, ඉඳි),කැන් සහිත කෙසෙල් ගස්, ගොප් කොළ, කෙසෙල්

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය - ඔක්තොම්බර් - සතිය - 03

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

නිපුණතා මට්ටම : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම : <u>ශාන්තිකරම හඳුනාගනිමු. (2 - කොටස)(දෙවොල් මඩුව)</u>

**සබරගමු නර්තන සම්ප්‍රදාය**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ මීට පෙර සතියේදි ඔබ අධ්‍යනය කළ ශාන්තිකර්ම පිළිබඳව තොරතුරු නැවත මතකයට නගා ගන්න.

දෙවන පියවර :මෙම සතියේදී ඔබ තවත් ශාන්තිකර්මයක් පිළිබඳව තොරතුරු සොයා බැලීය යුතුව ඇත.

තුන්වන පියවර : පහත සටහන කියවා ගිය සතියෙහි සිව්වන පියවරේ ප්‍රශ්න වලට මෙම ශාන්තිකර්මය ඇසුරින්ද පිළිතුරු සැපයීමට හැකිදැයි බලන්න.

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයකුගේ මානසික හෝ කායික හෝ සුභ සිද්ධිය අරමුණු කොට දෙවියන්, යක්ෂයන් නැතහොත් වෙනත් බලවේගයන්ගේ ආශිර්වාදයෙන් ඇති වී තිබෙන රෝග උපද්‍රව දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

**ශාන්තිකර්ම පැවැත්වීමට හේතු වූකරුණු:-** අතීතයේ පැවැත්වීමට හේතුව - පඬුවස් දෙව් රජුට වැදුණු දිවිදොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම.වර්තමානයේ පැවැත්වීමට හේතුව- ධන, ධාන්‍ය, ගව, මහිෂාදි භව භෝග සම්පත් වැඩි දියුණු කර ගැනීම/ පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයන් සුව කර ගැනීම/ගමකට, ප්‍රදේශයකට, මුළු රටට ම පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම / ආධ්‍යාපනික අවශ්‍යතා

**පුරාවෘත්ත කථාව:-** සේරමාන් නම් රජුගේ උයන පාළු කරමින් සිටි ගෝණකු මරා දමන ලෙසට අණ කරන ලද හෙයින් හේවායන් ඌ පසු පස එළවා යන අවස්ථාවේ ගෝණාගේ පය පැටලී අසල තිබූ පොකුණකට වැටී මරණයට පත් විය. තමා මේ විපතට පත් වීමට හේතු වූයේ රජතුමාගේ අණ කිරීම බව දැනගත් ගෝණා රජු කෙරෙහි වෛරයෙන් මිය ගොස් මෙම පොකුණෙහි කුඩා මැඩියකු වී උපදී. දිනක් රජු පොකුණට යන අවස්ථාවේ පිපී තිබූ මලක් කඩා එහි සුවඳ ආඝ්‍රාණය කරන විට එහි සිටි කුඩා මැඩියා නාසයට ඇතුළු වීම හේතුවෙන් රජුට බලවත් හිසරදයක් ඇති විය. ඉන් රෝගී තත්වයට පත් වූ රජුට නොයෙකුත් ප්‍රතිකාර කරන ලද නමුදු ඉන් සුවයක් නොගැබිණි. දිනක් රජුට ඉතා රූමත් කාන්තාවක් සිහිනයෙන් පෙනුණා ය. ඒ බව පුරෝහිත බමුණාට සැල කර සිටියේ ය. පුරෝහිත බමුණාගේ අදහස වූයේ සිහිනෙන් පෙනී සිටියේ පත්තිනි දේවිය බවත්, ඇගේ සාපයක් රජුට ඇති බවත් ය. බුද්ධාගම ස්ථාපිත රටකට ගොස් පත්තිනි දේවියට පින් පැමිණවිය යුතු බව දන්වා සිටිය හෙයින් ඊට සුදුසු ම රට ලංකාව බව තීරණය කළ රජු සීනිගමින් දිවයිනට පැමිණ රුවන්වැල්ලේ දී ප්‍රථම දෙවොල් මඩුව කර වී ය. එදා පටන් රජුගේ හිසරදය දුරු වූ බැවින් ලක්දිව දෙවොල් මඩුව ආරම්භ වූ බවත් කියවේ.

**පුද ලබන දෙවිවරු:-** පත්තිනි,දෙවොල්,වාහල,දොළහ දෙවියෝ

**නර්තන අංග:-**තෙල්මේ, වාහල නැටීම, දෙවොල් නැටී, දොළහ පෙළපාලිය. නාට්‍යමය අවස්තා:-අඹ විදමන,මරා ඉපැදීම,ගරා නැටීම

**චාරිත්‍ර විධි:-**කප් සිටුවීම,තොටමෙට යාම, මිල්ල කැපීම, බිසෝකප සිටුවීම , කාලපන්දම් පූජාව, තොරන් යාගය, මල්යහන් පූජාව, කිරි ඉතිරවීම.

**රංග වස්ත්‍රාභරණ:-** දෙවොල් මඩු ශාන්ති කර්මය පැවැත්වීමේ දී ප්‍රධාන වශයෙන් ඇඳුම් කට්ටල කීපයක් භාවිත කරනු ලැබේ.

1. තෙල්මේ ඇඳුම් කට්ටලය:-තෙල්මේ ඇඳුම් කට්ටලය නිර්මාණය කිරීමේ දී අනෙක් ඇඳුම් කට්ටලවලට වඩා සුවිශේෂත්වයක් දැකිය හැක. පබළු වලින් ගෙත්තම් කර අලංකාර ලෙස නිර්මාණය කර තිබීම එහි විශේෂත්වයයි.
2. දෙවොල් ඇඳුම් කට්ටලය:-දෙවොල් දෙවියන්ගේ ඇඳුමට සමාන යැයි පැවසේ.

**රංග උපකරණ (භාණ්ඩ):-** දොළහ පෙළ පාළියට භාවිත කරන රංග භාණ්ඩ හෙවත් පූජා භාණ්ඩ(බුලත්, දුම්මල,කොතලය, සේසත්,කුඩ,පොල්, සළුව), පොල්මල්, බිසෝ කප, කෙසෙල් බඩෙන් සාදා ගන්නා ලද ඇතා හා මීමා, ආදිය.

**වාද්‍ය භාණ්ඩ:-** පහතරටබෙරය, තාලම්පට, ආභරණ වැඩමවීමේ දී දවුල, තම්මැට්ටම, හොරණෑව භාවිත වන අවස්ථා ද තිබේ.

**සැරසිලි:-** පත්තිනි තොරණ, දෙවොල් තොරණ, සතරවරම් දෙවියන්ගේ මල් යහන්, වාහල තටුව, කාලපන්දම් ගස.

**යොදා ගන්නා අමුද්‍රව්‍ය:-** පස්වලු (දෝතළු, පුවක්, පොල්, තැඹිලි, ඉඳි),කැන් සහිත කෙසෙල් ගස්, ගොප් කොළ, කෙසෙල් බඩ, කෙසෙල් පතුරු, හබරල කොළ, ඉරටු, කෝටු ආදි ද්‍රව්‍ය.

සහායක ඉගෙනුම් ආධාරක

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය